# ෆ්‍රොයිඩියානු සිහින පිළිබඳ විශ්ලේෂණය සහ මනෝප්‍රතිකාරයක් වශයෙන් එහි ඇති වැදගත්කම පිළිබඳ අධ්‍යයනයක්

**මුවපැටිගේවෙල හේමාලෝක හිමි**

## හැඳින්වීම

සිහින පිළිබඳ විශ්ලේෂණය දර්ශනික, විද්‍යාත්මක, මනෝවිද්‍යාත්මක සහ ආගමික යන පුළුල් ක්ෂේත්‍ර ගණනාවකට විහිදී යයි. මේ සෑම ක්ෂේත්‍රයක් තුළින්ම සිහින පිළිබඳ සුවිශේෂී අර්ථකථන රාශියක් ඉදිරිපත් වී ඇත. නූතන විද්‍යාවේ සිහින පිළිබඳ අධ්‍යයන කරන ක්ෂේත්‍රය හඳුන්වනු ලබන්නේ oneirology නමිනි.[1] සිහින යනු නින්දේ කිසියම් අවදියක දී මනසේ අනිච්චානුගව ඇතිවන ප්‍රතිබිම්බ, අදහස්. හැඟීම් සහ සංවේදනයන් සන්තතියකි.[2] සාමාන්‍යයෙන් පුද්ගලයාට සිහින දර්ශනය වන්නේ මොළයේ ක්‍රියාකාරීත්වය ඉතා ඉහළ මට්ටමෙන් පවතින නින්දේ Rapid-eye Movement (REM) යන අවදියේදීය.[3] කෙසේවුවද සිහිනවල අන්තර්ගතය සහ අරමුණ කුමක්ද යන්න පිළිබඳ පැහැදිලිව අවබෝධ කර ගැනීමට තවමත් නොහැකි වී තිබේ.

## සිහින විශ්ලේෂණයේ ඉතිහාසය

සිහින පිළිබඳ අධ්‍යයනයේ ඉතිහාසය වසර දහස් ගණනක් තරම් ඉතා ඈත අතීතයට දිවයන අතර එකී ඉතිහාසය පෙරදිග සහ අපරදිග වශයෙන් අංශ දෙකක් ඔස්සේ අධ්‍යයන කළ හැකිය. පෙරදිග සාහිත්‍යයේ සිහින දැකීම පිළිබඳ පළමු ලිඛිත සාක්ෂිය හමුවන්නේ උපනිෂද් ග්‍රන්ථ වලිනි. "Vigyan Bhairav" නම්



ඉපැරණි හින්දු කෘතියේදී සිහින තුළ සිදුවන සෘජු විඥනය සහ නින්දේ සිහින දකින අවස්ථාවන් පිළිබඳ විස්තර කොට ඇත. ඉපැරණි බෞද්ධ සම්ප්‍රදයන් තුළ ද සිහින භාවනාව සඳහා වසර 12000 තරම් දිගු ඉතිහාසයක් තිස්සේ භාවිත කරන ලද බව සඳහන් වේ.[4] විශේෂයෙන්ම පාලි ත්‍රිපිටකය තුළද විවිධ වර්ගයේ සිහින සහ ඒවායෙහි අන්තර්ගතයන් පිළිබඳ විශ්ලේෂණයන් සහ අර්ථකථනයන් ඇතුළත් වේ. පැරණි ඊජිප්තුවානුවෝ සහ බැබිලෝනියානුවෝ සිහින අනාගතය පිළිබඳ යම් යම් දේ හෙළිකරන බවත් ඒවාට දිව්‍යමය අර්ථයක් ඇති බවත් විශ්වාස කළහ. ඇරිස්ටෝටල් සිහින මනෝවිද්‍යාත්මක ප්‍රපංචයන් ලෙස අර්ථකථනය කරනු ලැබූ අතර ඒවා පුද්ගලයා නිදිගත් අවස්ථාවේ තමා තමාගේ ආත්මය දෙස බලන අවස්ථාවන් වශයෙන් ද සැලකීය.[5] 19 වන සියවසේ මැද භාගයේදී සිහින පිළිබඳ පළමු විද්‍යාත්මක අධ්‍යයනය සිදු කරනු ලැබුවද 1900 දි ෆ්‍රොයිඩ්ගේ සිහින විශ්ලේෂණය පිළිබඳ ග්‍රන්ථය එළිදක්වනතුරු ඉහත කී අධ්‍යයනය ප්‍රසිද්ධ කිරීමට නොහැකි විය.

## සිහින විශ්ලේෂණය සහ එහි ප්‍රතිකාරාත්මක වැදගත්කම

ෆ්‍රොයිඩ්ගේ විග්‍රහයට අනුව සිහින යනු පුද්ගලයාගේ ආශාවන් සපුරාගැනීමයි. එනම් පුද්ගලයා අවදියෙන් සිටින අවස්ථාවේ දී ඔහුට ඇතිවන අභිලාෂයන් සිහින තුළින් තෘප්තිමත් කර ගැනීමට උත්සාහ දැරීමයි.[6] සිහින ප්‍රකට සහ අප්‍රකට යන අන්තර්ගතයන් දෙකෙන්ම යුක්ත වේ. පුද්ගලයාගේ සාමාන්‍ය සවිඥනිකත්වයෙන් ලඟාවිය නොහැකි මනසේ කොටස්වලට සිහින තුළින් ලඟාවිය හැකි නිසා ෆ්‍රොයිඩ් සිහින යනු අවිඥනික මනසට ලඟාවිය හැකි රාජකීය මාවතක් බව ප්‍රකාශ කළේය.[7]

සිහිනවල පිටතට පෙනෙන කොටස (Manifest Content) තුළ පුද්ගලයාට සවිඥානික විය හැකි මතකයන් අන්තර්ගත වේ. එහිදී සිහිනය තුළ අන්තර්ගත වූ ප්‍රතිබිම්බ, සිතුවිලි ආදිය නැවත සිහිකිරීම තුළින් මතකයට නඟාගත හැකිය. එහෙත් ඒ තුළින් සිහිනයේ සැබෑ අර්ථය දැනගත නොහැකිය. මතුපිට අර්ථය සිහිනයේ අන්තර්ගතය පිළිබඳ කිසියම් ඉඟියක් නැතහොත්

හෝඩුවාවක් පමණි. ඒ ඔස්සේ සිහිනය විශ්ලේෂණය කිරීම මගින් සැගවුණු හෙවත් සැබෑ අර්ථය (Latent Content) ඉස්මතුකරගත හැකිය. පිටතට නිරීක්ෂණය කලහැකි කොටස සමස්ත සිහිනයේ එක්තරා නියෝජනයක් පමණි.

සිහිනයේ සැඟවුණු කොටස තුළ අන්තර්ගත වන්නේ පුද්ගලයාගේ අවිඥානයේ පවතින සිතුවිලි හැඟීම් සහ ආශාවන්ය. විශේෂයෙන්ම අවිඥානික ලිංගික ප්‍රේරණයන් සිහින තුළ ඇතුළත් වේ. මෙකී හැඟීම් සහ ආශාවන් පුද්ගලයා එදිනෙදා ජීවිතයේ මැඩපවත්වන ලද නැතහොත් යටපත් කරන ලද ඒවාය. ඇතැම් විට ඒවා ළමාකල යටපත් කරන ලද ඒවා විය හැකිය. ෆ්‍රොයිඩ්ට අනුව ඒවා පිටතට පැමිණෙන ආකාර ගණනාවක් ඇත. සිහින දැකීම යනු එහි එක් ප්‍රකාශන මාධ්‍යයකි.

ෆ්‍රොයිඩ් ප්‍රකාශ කරන අන්දමට සෑම සිහිනයක්ම පෙර දිනයේ ලබන ලද අත්දැකීම් සමග කිසියම් සම්බන්ධයක් පවති. ඇතැම්විට එම සම්බන්ධය ඉතා සුළු එකක් වුවද සිහිනවල අන්තර්ගතයන් සිහින දකින්නාගේ ඕනෑම පෙර අත්දැකීමක කොටසක් විය හැකියි ෆ්‍රොයිඩ් සිහින දර්ශනය වීම සඳහා හේතුවන ප්‍රධාන මූලාශ්‍ර 4ක් පෙන්වා දෙයි.

(1) ඍජුව ඉදිරිපත් වූ වැදගත් මානසික අත්දැකීම්

(2) මෑතකදී මුහුණදෙන ලද වැදගත් අත්දැකීම් කිහිපයක් සිහිනයක් මගින් එකමුතුවක් ලෙස ඉදිරිපත් වීම

(3) සිහින අන්තර්ගතය තුළ නිරූපණය වන මෑතකාලීන වැදගත් අත්දැකීම් එකක් හෝ කිහිපයක්, වර්තමානකාල එහෙත් එකිනෙකට වෙනස් අත්දැකීම්.

(4) මතකයක් හෝ සිතුවිලිදමයක් වැනි වැදගත් අභ්‍යන්තර අත්දැකීමක් සිහිනය තුළ නොවෙනස්ව අන්තර්ගත වීම.[8]

ෆ්‍රොයිඩ් සඳහන් කරන ලද සිහින දැකීම සඳහා මූලාශ්‍රය වන ඉහත කරුණු අධ්‍යයනය කිරීමේදී පෙනීයන්නේ සිහින පුද්ගලයා ජීවිතයේ කුමන හෝ අවදියක ලබන ලද අත්දැකීම් වලින් බිඳී පැමිණ ඇති බවයි. මෙහිදී පුද්ගලයා මුහුණ දෙනු ලැබූ



අත්දැකීම්වල අන්තර්ගතයන් පිළිබඳව අවධානය යොමු කිරිම ඉතා වැදගත් වේ. මන්ද පුද්ගලයාගේ සෑම අත්දැකීමක්ම සිහින දර්ශනය වීම සඳහා හේතු නොවන බැවිනි. ෆ්‍රොයිඩ්ගේ විග්‍රහයට අනුව එම අත්දැකීම් තුළ බොහෝ සෙයින් අන්තර්ගත වන්නේ පුද්ගලයාගේ ඉටු නොවූ ආශාවන් සහ චිත්තවේගාත්මක ගැටුම්ය. කෙසේනමුත් පුද්ගලයාගේ සෑම සිහිනයක්ම අවරෝධිත අත්දැකීම් වලින් බිඳී ආ ඒවා නොවේ. ඇතැම් සිහින නිදන කාමරයේ උෂ්ණත්වය, සහකරුවාගේ හෝ සහකාරියගේ ශරීරය ස්පර්ෂ වීම, නින්දට පෙර අධික ලෙස ආහාර ගැනීම වැනි සරල හේතු නිසාද දර්ශනය විය හැකිය.

සිහිනවල අන්තර්ගත සංකේත සිහින විශ්ලේෂණ ක්‍රියාවලියේදී ඉතා වැදගත් වේ. ෆ්‍රොයිඩ් බොහෝ සංකේතවලට අර්ථකථන ලබාදී තිබේ. මෙම සංකේත සෑම මිනිසෙකුටම පොදු වූ විශ්වසම්මත ඒවා හෝ ඒ ඒ පුද්ගලයාගේ අත්දැකීමට අදාළ සංකේත විය හැකිය. ෆ්‍රොයිඩ් විසින් පෙන්වා දෙන ලද එබඳු පොදු සංකේත සහ ඒවාට ඔහු ලබාදුන් අර්ථකථන රාශියක් පහත දැක්වේ.

- ප්‍රසන්න මුහුණුවරක්ගත් නිවස - පුරුෂ දේහය
- ගැටිය සහ සඳළුතලාව සහිත නිවස - ස්ත්‍රී දේහය
- රජු සහ දේවිය - දෙමව්පියන්
- කුඩා සතුන් - ළමයි
- දරුවන් - ජනනේන්ද්‍රිය
- ළමුන් සමග ක්‍රීඩා කිරීම - ස්වයං වින්දනය කිරීමට ඇති කැමැත්ත
- මුඩුහිස (තට්ටය), දත් ගැලවීම (ඇදදැමීම) - කප්පාදු කිරීම (අණ්ඩහරණය)
- දිගටි වස්තූන් (උදා-ගස් කඳන්, කුඩ, කරපටි, සර්පයින්, විලක්කු) - පුරුෂ ලිංගය
- වැසුණු අවකාශ (හිදැස්) (උද÷ මංජුසා, පෝරණු, ඇතුල්ගේ, ගුහා, මුදල් පසුම්බි) - ස්ත්‍රී ලිංගය

- සෝපානයට නැගීම, වාහන පැදවීම, අශ්වයන් පැදීම, පාලමින් එතරවීම - ලිංගිකව එකතුවීම (සංසර්ගය)
- ස්නානය කිරීම - උපතක් සිදුවීම
- ගමනක් ආරම්භ කිරීම - මියයෑම
- පිරිසක් මැද නිර්වස්ත්‍රව හිඳීම - සැලකිල්ලට භාජනය වීමට ඇති කැමැත්ත
- පියාසර කිරීම (ඉගිල්ලීම) - අගය කිරීමට කැමැතිවීම
- ඇදවැටීම - යම් තත්ත්වයකට නැවත පත්වීමට ඇති කැමැත්ත (ළමාකාලය වැනි තෘප්තිමත් හා ආරක්ෂිත වූ තත්වයකට නැවත පත්වීමට ඇති කැමැත්ත)[9]

ෆ්‍රොයිඩ් 1900 දී තම සිහින විශ්ලේෂණය නම් ග්‍රන්ථය තුළින් සිහින සංකේත සහ අර්ථකථනයන් ඉදිරිපත් කළේය. එහි සඳහන්වන බොහෝමයක් සිහින ෆ්‍රොයිඩ් තමා විසින්ම අත්දකින ලද ඒවා වීම සුවිශේෂී කරුණකි. ඔහු සෑම දිනකම අවසන් අඩහෝරාවක කාලය සිහින විශ්ලේෂණය සඳහා යොදාගත්තේය. එසේ තමා විසින්ම අත්දකින ලද සිහින 40 කට අධික ප්‍රමාණයක් ඔහු සිය කෘතියේදී විශ්ලේෂණය කොට ඒවාට අර්ථකථන ලබාදී ඇත.[10]

පුද්ගලයාගේ අවිඥානික මනසෙහි පවත්නා අවරෝධිත අත්දැකීම් අනාවරණය කරගැනීම මනෝප්‍රතිකාරයට අත්‍යවශ්‍ය වූවකි. මන්ද සේවාලාභියා කට වචනයෙන් ප්‍රකාශ කරන දෑ තුළින් ඔහුගේ මානසික ගැටලුවට අදාළ සෑම පැතිකඩක්ම අනාවරණය නොවීමයි. එබැවින් ෆ්‍රොයිඩ් පුද්ගල අවිඥානය පිළිබඳ අනාවරණය කරගැනීම සඳහා සිහින විශ්ලේෂණයට අමතරව නිදහස් සංසටන ක්‍රමවේදය ද භාවිත කළේය. තවදුරටත් ඔහු සිහින විශ්ලේෂණය සඳහා උපකාරවන එකිනෙකට වෙනස් ක්‍රියාවලීන් පහක් පමණ දක්වා ඇත.



1. විස්ථාපනය

   එක් දෙයකට හෝ එක් පුද්ගලයෙකුට ඇති කැමැත්ත වෙනත් දෙයක් හෝ වෙනත් පුද්ගලයෙකු මගින් සංකේතකරණය කරන විට දී විස්ථාපනය සිදු වේ.

2. ප්‍රක්ෂේපණය

   මෙය සිදු වන්නේ සිහින දකින්නා ඔහුගේ අභිලාෂයන් වෙනත් පුද්ගලයෙකුට ආරෝපණය කිරීමට අවශ්‍ය වූ විටය.

3. සංකේතකරණය

   සිහින දකින්නාගේ අවිඥානික අවරෝධිත ප්‍රේරණයන් සහ ආශාවන් රූපකාත්මකව පිටතට පැමිණීමට ඉඩ හැරීම මෙමගින් අදහස් වේ.

4. සංක්ෂේපය

   සිහින දකින්නා ඔහුගේ හැඟීම් සහ ප්‍රේරණයන් එහි නිරූපණයන් කුඩා සිහින ප්‍රතිබිම්බයකට හෝ සිදුවීමකට කැටිකිරීම හෝ හැකිතාක් අවම කිරීම හරහා සැඟවීම.

5. යුක්ති ප්‍රතිපාදනය

   මෙය සිහින විශ්ලේෂණය සඳහා උපකාරවන අවසාන ක්‍රියාවලියයි. මෙහිදී සිහින දකින මනස හිතාමතාම නොගැළපෙන සිහින වඩාත් පිළිගත හැකි සහ තර්කානුකූල ලෙස සංවිධානය කරගනියි.[11]

සිහින විශ්ලේෂණය කොට එයින් ලබාගන්නා තොරතුරු මනෝප්‍රතිකාරයේ දී ඉතා වැදගත් වේ. එබැවින් ෆ්‍රොයිඩ් සිහින විශ්ලේෂණයේ දී හඳුනාගත යුතු ප්‍රධාන සිහින වර්ග තුනක් පිළිබඳව සඳහන් කරයි.

(1) අනාගතය පිළිබඳ සෘජු අනාවැකි අන්තර්ගත සිහින (Chrematsmos, oraculum)

(2) අනාගත සිදුවීමක් පිළිබඳව කිසියම් පූර්වකථනයක් කළහැකි සිහින (oram, vision)

(3) සංකේතාත්මක සිහින හෙවත් අර්ථකථනය කළයුතු සිහින.[12]

ෆ්‍රොයිඩ් ප්‍රකාශ කරන ආකාරයට සෑම සිහිනයක්ම අර්ථකථනය කළයුතු නැත. ඇතැම් සිහින මගින් අනාගතයේ සිදුවන්නට තිබෙන දෙයක් සෘජුවම දර්ශනය විය හැකිය. එසේම ඇතැම් සිහින මගින් අනාගතයේ සිදුවන්නට තිබෙන යම් දෙයක් පිළිබඳ පූර්වකථනයක් ඉදිරිපත්විය හැකිය. එබඳු සිහින සඳහා විශ්ලේෂණ හෝ අර්ථකථන ලබාදියයුතු නැත. විශ්ලේෂණය කොට අර්ථකථනය කළයුත්තේ සංකේතාත්මක ස්වරූපයෙන් දර්ශනය වන සිහිනයන්ය. ඕනෑම ආකාරයේ සංකේතයක් තුළින් එහි අන්තර්ගතය සම්පූර්ණයෙන්ම පිටතට ප්‍රකාශ නොකෙරේ. සංකේතයක් යනු අන්තර්ගතයේ කිසියම් නියෝජනයක් පමණි. එබැවින් සංකේතවලින් හඟවනු ලබන අර්ථයන් ඉස්මතුකොටගත යුතුය. ඒ සඳහා සංකේතාත්මක ස්වරූපයේ සිහින විශ්ලේෂණය කළ යුතුය.

ෆ්‍රොයිඩ් සිහින විශ්ලේෂණය ආරම්භ කළේ 1895 දී ඔහු තමා විසින්ම තම රෝගියෙකු පිළිබඳව දුටු සිහිනයක් මුල්කොටගෙනය. ඉර්මා නම් කාන්තාවකට ප්‍රතිකාර කරමින් සිටි ඔහු ඇයගේ රෝගී තත්වය බලාපොරොත්තු වූ පරිදි සුවපත් නොවන බව නිරීක්ෂණය කළේය. එය ඔහු තුළ වරදකාරී හැඟීමක් ඇතිවීමට හේතු විය. මේ අතර ෆ්‍රොයිඩ් සාදයක දී එම කාන්තාව මුණගැසී ඇය පිළිබඳව ඇගයීමක් කරන අවස්ථාවක් සිහිනයක් මගින් දුටුවේය. එම සිහිනය තුළ දී ඔහුට එම කාන්තාවට වෙනත් වෛද්‍යවරයෙකු විසින් රසායනික සංයුතියක් අඩංගු ඖෂධයක් ලබාදෙන අවස්ථාවක් ද දර්ශනය විය. එම වෛද්‍යවරයා විසින් ඖෂධ ශරීරගත කිරීම සඳහා භාවිත කරන ලද අපිරිසිදු නළය (Dirty Syringe) පෙර කාන්තාවගේ රෝගී තත්වය සුවනොවීම



සඳහා බලපෑ බව ෆ්‍රොයිඩ්ට අවබෝධ විය. මෙහිදී රෝගියාගේ රෝගී තත්වය සුවපත් නොවීම නිසා ෆ්‍රොයිඩ් තුළ වරදකාරී බවක් ඇති වූ බව පැහැදිලිය. ඔහුට එය ඔහුගේම වරදක් බව හැඟුණි. එහෙත් ෆ්‍රොයිඩ්ට එය ඔහුගේ වරදක් නොවන බවට බලාපොරොත්තුවක් ද (wish) තිබුණි. සිහිනය මගින් සම්පූර්ණ (fulfillment) වූයේ ඔහුගේ එම බලාපොරොත්තුව නැතහොත් ප්‍රාර්ථනාවයි.[13]

ෆ්‍රොයිඩියානු මනෝප්‍රතිකාරය ගොඩනැගෙන්නේ අවිඥානික මානසික සාධක පදනම්කොටගෙනය යන්න ඉතා පැහැදිලි කරුණකි. ඔහු බොහෝවිට සිහින විශ්ලේෂණය යොදාගත්තේ සෘජු මනෝප්‍රතිකාරයක් වශයෙන් නොව ප්‍රතිකාරයට අවශ්‍ය අවිඥානික මානසික තොරතුරු ලබාගැනීමේ මාධ්‍යයක් ලෙසය. ඔහුට එහිදී නිදහස් සංසටන ක්‍රමය ද බෙහෙවින් ඉවහල් විය.

ෆ්‍රොයිඩියානු සිහින විශ්ලේෂණයේ ප්‍රතිකාරාත්මක අගය අවබෝධකොටගත් පසුකාලීන මනෝවිශ්ලේෂණවාදීන් ඇතුළු බොහෝ මනෝප්‍රතිකාරඥයින් සිහින විශ්ලේෂණ ක්‍රමය මනෝප්‍රතිකාරයේදී ඵලදායි ලෙස යොදාගනු ලැබූහ. පසුකාලීන මනෝප්‍රතිකාරඥයින් සාර්ථක ලෙස සිහින විශ්ලේෂණ ක්‍රමය යොදාගත් ආකාරය පිළිබඳ අවබෝධයක් ලබාගැනීමට ඔවුන් විසින් විශ්ලේෂණය කොට අර්ථකථනය කරන ලද සිහින කිහිපයක් පහත දක්වමු.

**සිහිනය**

මම මඳවේලාවක් ගතකිරීමට ස්ථානයක් සොයමින් සිටින විට මා හට සිටීමට පොකුණු වලින් සහ ගංගාවලින් වට වූ ඉතා විශාල නිවසක් ලැබුණි.

**අර්ථකථනය**

මෙහිදී තමා කිසියම් කරදරකාරී තත්වයකට පත් වී සිටින විට එයින් මුදවාගැනීමට කිසියම් පුද්ගලයෙකු බලාපොරොත්තුවෙන් සිටින අවස්ථාවක් ගම්‍ය වේ.

### සිහිනය

තමා අකමැති පවුල් සාමාජිකයෙකු නිවසට පැමිණියේය. මඳවේලාවකින් ගෙලසිඳ මරාදමන ලද ඔහුගේ සිරුර නිවසින් හමු විය. වෙනත් පවුලේ සාමාජිකයෙකු විසින් ඔහු ඔහුගේම ගෙලසිඳගනිමින් එය කොතරම් පහසු කාර්යයක් දැයි මට පෙන්වීය. මම දුරසිට එය නිරීක්ෂණය කළ අතර බියට පත් නොවීමි. මා හට එය ආශ්වාදජනක සිදුවීමක් විය.

### අර්ථකථනය

මෙයින් අදහස් වන්නේ පුද්ගලයා අනෙක් මිනිසුන් දුරින් ඇසුරු කිරීමට වඩාත් නැඹුරු වන බවයි. ඔවුන් සමග සම්බන්ධ වීමට අකමැති බවත් එමගින් තවදුරටත් ගම්‍ය වේ. එසේම අතීතයේදී මුහුණදුන් ගැටලුකාරි තත්වයන්, පීඩාකාරී හැඟීම්, නොයෙක් ආකාරයේ පීඩාකාරී අත්දැකීම් නැවත සිහිපත් වීම ද මෙම සිහිනය මගින් නිරූපණය කෙරේ.[14]

නිවැරදි ලෙස සිහින අර්ථකථනය කිරීම මගින් ප්‍රතිකාරාත්මක රාමුව කුමන දිශාවකට කේන්ද්‍රගතවිය යුතුද යන්න පිළිබඳ පැහැදිලි අවබෝධයක් ලබාගැනීමට මනෝප්‍රතිකාරඥයාට හැකියාව ලැබේ. සිහින සැමවිටම රෝගියාගේ ගැටලුවේ මූලයට අදාළ වැදගත් ඉඟි ලබාදේ. එබැවින් සිහින මගින් නිරූපණය කරනු ලබන සංකේත අර්ථකථනය කිරීම සඳහා මනෝප්‍රතිකාරඥයාට මනා පරිචයක් පැවතිය යුතුය.

## සමාලෝචනය

ඒ අනුව මෙහිදී පළමුව සිහින පිළිබඳ පොදු අර්ථකථනයක් සහ සිහින විශ්ලේෂණයේ ඉතිහාසය පිළිබඳ සංක්ෂේපයෙන් කරුණු ඉදිරිපත් කළෙමු. අනතුරුව ෆ්‍රොයිඩ් විසින් සිහින විශ්ලේෂණය සහ අර්ථකථනය සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද අදහස්, සංකල්ප පිළිබඳ විස්තරාත්මකව සාකච්ඡා කළෙමු. විශේෂයෙන්ම සිහින මගින් නිරූපණය වන සංකේතවලට ෆ්‍රොයිඩ් විසින් ලබාදුන් අර්ථකථනයන් පිළිබඳ අවධානය යොමු



කළෙමු. සිහින විශ්ලේෂණයෙන් සහ අර්ථකථනයෙන් ලබාගත් දැනුම මනෝප්‍රතිකාරයේදී කොතරම් දුරට වැදගත් වන්නේ ද යන්න පිළිබඳව ද මෙහිදී සාකච්ඡා කොට ඇත. ඉහත කරුණු සමාලෝචනය කිරීමේදී පෙනීයන්නේ සිහින විශ්ලේෂණය සහ අර්ථකථනය සම්බන්ධයෙන් නූතන වෛද්‍ය විද්‍යාත්මක ස්ථාවරය කෙසේවුවද ෆ්‍රොයිඩ් ඇතුළු මනෝප්‍රතිකාරඥයින් මානසික ගැටලු හෝ රෝග වලින් පෙළෙන්නන්ට ප්‍රතිකාර කිරීම සඳහා සිහින විශ්ලේෂණය ඵලදයි ලෙස යොදාගෙන ඇති බවයි.

## ආන්තික සටහන්

1 Kavanau, J. L., (2000) "sleep, memory maintenance, and mental disorders", journal of neuropsychiatry and clinical neuroscience. 12(2)

2 American heritage publishing company (2000) the American heritage dictionary of English language (fourth edition)

3 Hobson, J.A., (2009) "REM sleep and dreaming: towards a theory of protoconsciousness" Nature Reviews Neuroscience. 10(11): 803-813

4 Bulkery. K., (1996) spiritual dreaming, network, paulist press

5 Pre-History hypothesis about dreams from ancient times to the end of the 19th century. In Freudian Museum London.Retrieved from. http://www.freud.org.uk/education/topic/10576 /subtopic/40021

6 Freud, Sigmund. (2010) the interpretation of dreams. Strachery, James. New York: Basic Books A Member of the Perseus Group.p 121

7 Ibid, p 604

8 Ibid, p192

9 Kavanau, J. L., (2000) "sleep, memory maintenance, and mental disorders", journal of neuropsychiatry and clinical neuroscience. 12(2)

10 Schultz, Duane P., Schultz, Sydney Ellen, (2004) A History of Modern Psychology, Thomson Wasdsworth, Belmont, USA, p 419

11 Ibid, p 410

12 Freud, Sigmund. (2010) The interpretation of dreams. Strachery, James. New York: Basic Books A Member of the Perseus Group.p162.163.328

13 Retrieved from, https:en.m.wikipedia/wiki/The-interpretation-of –dreams

14 Storr, Anthony (1989) Freud: A Very Short Introduction, Oxford: Oxford University Press.p 41